# ලංසු ආරාධනය.

## උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බැදිවැව හෙළ රස පියස (දේශීය ආහාර භෝජන ශාලාවක්) කුලියට දීම සඳහා මිල ගණන් කැඳවීම.

උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බැදිවැව හෙළ රස පියස (දේශීය ආහාර භෝජන ශාලාවක්) කුලියට දීම සඳහා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති/ පළාත් ආයුර්වේද කොමසාරිස් වන මා විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

01. කුලියට ලබා දෙන කාලය වර්ෂ 03 කි. (2026/2027/2028 වර්ෂ සඳහා)
02. මිලදී ගැනීමට අදාළ මිළ කැඳවීම් ආකෘති පත්‍රයේ සඳහන් සුදුසුකම් සපුරන සැපයුම්කරුවන් විසින් මිළ ගණන් ඉදිරිපත් කල යුතුය. සම්පූර්ණ ලංසු ලියවිලි අනුරාධපුර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙතින් 2026.03.09 වන දින සිට 2026.03.26 දින දක්වා සතියේ වැඩකරන දින වල පෙ.ව.9.00 - ප.ව 3.00 අතර කාලයේ ආපසු නොගෙවන රු. 1000.00 ක මුදලක් ගෙවා ලබාගත හැක.
03. මෙම දේශීය ආහාර භෝජන ශාලාවට අදාළව රු.50,000.00ක අවම මාසික කුලී වාරිකයක් නියම කරනු ලබන අතර, එම මිලට වඩා අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
04. ලංසු ඉදිරිපත් කරන ලංසුකරුවන් හට රජයේ ආයතනයක හෝ පෞද්ගලික ආයතනයක ආපන ශාලාවක් පවත්වා ගෙන යාම පිළිබඳව අවම වශයෙන් අවුරුද්දක පමණ පළපුරුද්දක් තිබිය යුතු අතර ඉදිරිපත්වන ලංසුකරුවන් හට දේශීය ආහාර වර්ග හා ඔසු වර්ග අඩංගු පාන වර්ග සහ පළතුරු ආශ්‍රිත නිෂ්පාදන සැකසීම පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ. (තහවුරු කිරීමට ලේඛන අමුණා ඉදිරිපත් කරන්න.)
05. මේ සම්බන්ධ වැඩි විස්තර 025-2054053 දුරකථන අංකයෙන් මුදල් සහකාර අමතා කාර්යාල වේලාව තුල දී ලබා ගත හැකිය.
06. ලංසුකරුවන් විසින් තම ලංසු 2026.03.27 දින ප.ව 02.00 ට පෙර පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ නිළ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම මඟින් හෝ ලියාපදිංචි තැපැලෙන් එවීම සිදු කල යුතු අතර, 2026.03.27 දින ප.ව. 02.00ට ලංසු භාර ගැනීම අවසන් වූ වහාම අදාළ ලංසු විවෘත කරනු ලැබේ.මේ සඳහා ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී වීමට ඉඩ දෙනු ලැබේ.
07. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති/ පළාත් ආයුර්වේද කොමසාරිස්,
ප්‍රසම්පාදන මණ්ඩලය,
පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව,
උතුරු මැද පළාත,
ධර්මපාල මාවත,
අනුරාධපුර.
2026.03.06